# ඉගෙනුම් මාරුව

එල්.ඒ.එම්. හංසනී ප්‍රමිලා උදයකුමාරි

## හැඳින්වීම

අධ්‍යාපනය යනු ඉගෙනීමේ හෝ ඉගැන්වීමේ ක්‍රියාවලිය හෝ ක්‍රියාව යි. එනම් දැනුම ලබා ගැනීම හෝ ලබා දීමයි. පදයේ අර්ථය එහි සන්දර්භය අනුව, එය පවසන්නේ කවුද සහ කොතැනද යන්න වෙනස් විය හැක. කෙසේ වෙතත්, බොහෝ අවස්ථාවන්හි දී, මිනිසුන්ගේ තර්ක කිරීමේ සහ විනිශ්චය කිරීමේ කුසලතා වර්ධනය කිරීම ද එයට ඇතුළත් වේ (Gettrick, 2004). අධ්‍යාපනය යනු දැනුම සම්ප්‍රේෂණය කිරීම හෝ කුසලතා සහ චරිත ලක්ෂණ පෝෂණය කිරීම වැනි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යොමු කරන ලද අරමුණු සහිත ක්‍රියාකාරකමකි. මෙම අරමුණු අතර අවබෝධය, තාර්කිකත්වය, කරුණාව සහ අවංකභාවය වර්ධනය කිරීම ඇතුළත් විය හැකි ය. සැම විට ම යම් ඉගෙනීමක් සිදු වන්නේ හුදකලාව ම නොවන අතර අප පෙර ලද ඉගෙනීමක් සැම විටම පසු ඉගෙනීමකට සම්බන්ධ වේ. එනම් එකිනෙකට සම්බන්ධ ඉගෙනීම් ජාලයක් මත පදනම් ව අප ඉතා ඉක්මනින් යම් යම් දේ ග්‍රහණය කර ගනියි.

ඉගෙනුම් මාරුව යන්නෙන් අදහස් කරන්නේ පුද්ගලයෙකු එක අවස්ථාවක දී ලද පුහුණුව හෝ ඉගෙනීම පසු අවස්ථාවක දී යොදා ගැනීම ලෙස සරල ව කිව හැකි ය. විෂයමාලා සම්පාදනයේ දී සැමවිට ම එයට විෂයන් ඇතුළත් කරනුයේ එම විෂයන් ඉගෙනීමෙන් ලබන දැනුම, කුසලතා සහ සමස්ත අත්දැකීම පසු කාලීන ජීවිත අවස්ථාවන්ට යොදා ගැනීමට හැකිවේය යන පදනම මතය. ගණිතය, විද්‍යාව, භාෂාව... ආදී නේකවිද විෂයන් අපගේ ජීවිතයේ පසුකාලින අවස්ථාවන්ට සහ අත්දැකීම් සඳහා බලපාන බව කිව හැකි ය. ඉගෙනුම් මාරුව පුහුණු මාරුව යනුවෙන් ද හඳුන්වයි. එච්.සි.එලිස්ට අනුව ඉගෙනුම් මාරුව යනුවෙන් අදහස් කරන්නේ කිසියම් කාර්යයක් පිළිබඳ ව ලබන පුහුණුව හෝ අත්දැකීම් හෝ ඊට පසුව මුණ ගැසෙන කාර්යයක් කෙරෙහි ඇති කරන බලපෑමයි (මුතුලිංගම්, 1979). තවද

පාසලේ සිසුන්ට ඉතා විධිමත් සහ මනා පුහුණුවක් ලබා දීම සඳහා ගුරුවරයා ලෙස අප සියලු දෙනාට මෙම සංකල්පය ඉතාම වැදගත් වේ.

ඉගෙනුම් මාරුවේ ස්වරූප කිහිපයක් තිබේ. ප්‍රතිජනනාත්මක ඉගෙනුම් මාරුව, ප්‍රතිශේධාත්මක ඉගෙනුම් මාරුව සහ ඉගෙනුම් මාරුව නොපැමිණි අවස්ථාව යනුවෙනි. පළමු අවස්ථාවක දී පුද්ගලයෙක් ලද පුහුණුවක් පසු අවස්ථාවක දී සාර්ථකව යොදා ගැනීම ප්‍රතිජනනාත්මක ඉගෙනුම් මාරුව යනුවෙන් හඳුන්වන අතර, බොහෝ පර්යේෂකයන් පෙන්වා දෙන්නේ, අධ්‍යාපනයෙන් මෙම ප්‍රතිජනනාත්මක ඉගෙනුම් මාරුව සිදුවන බවයි. මෙය, සකාර්ය පුහුණු මාරුව සහ ධනාත්මක පුහුණු මාරුව යන නම් වලින් ද හඳුන්වයි. ප්‍රතිශේධාත්මක ඉගෙනුම් මාරුව යනුවෙන් හඳුන්වන්නේ පළමු අවස්ථාවක දී ලද පුහුණුවක් හෝ ඉගෙනීමක් පසු අවස්ථාවකට බාධාකාරී ආකාරයට බලපෑමයි (ජයසූරිය, 1974). ඉගෙනුම් මාරුවක් සැබවින් ම සිදු වන්නේ නම් එය සිදුවන ආකාරය සම්බන්ධයෙන් ද විමසා බැලිය යුතු ය. සාමාන්‍යයෙන්, එක මානසික කාර්යයක්, ඒ හා සමාන මූලධර්ම ඇති කාර්යයකට මාරුවන බව කිව හැකි ය. තවද යම්කිසි පුද්ගලයෙකු යම් ඉගෙනීමකට ආරෝපණය වූ විට එම ඉගෙනුම පසු අවස්ථා කෙරෙහි ද බලපාන බව කිව හැකි ය. එනම් අපගේ ජීවිතයේ කිසියම් හෝ අවස්ථාවක ලබාගත් දැනුම, පුහුණුව හෝ ඉගෙනීම, තමාගේ ජීවිතයේ පසු කාලීන අවස්ථාවකට යොදා ගන්නේ නම් එහිදී අනිවාර්යයෙන් ම පුහුණු මාරුව ඇති වන බව කිව හැකි ය (නෙත්තානන්ද, 1973). ඉගෙනුම් මාරුව සම්බන්ධයෙන් ඇති විවිධාකාර විග්‍රහයන්/ න්‍යායන් කිහිපයකි.

- මානසික විනය පිළිබඳ මතය
- සර්වසම අංග පිළිබඳ න්‍යාය
- සංඝටනවාදී න්‍යාය
- සාමාන්‍යකරණය පිළිබඳ න්‍යාය
- තැත්මාරුව පිළිබඳ න්‍යාය
- ඉගෙනීමට ඉගෙනීම පිළිබඳ න්‍යාය

ඉන් කිහිපයකි. මානසික විනය පිළිබඳ මතය ප්‍රධාන වශයෙන්, සම්භාව්‍යය භාෂා ඉගෙනුමෙන් මනස හොඳින් පුහුණුවන බව කියවෙන ප්ලේටෝගේ සම්භාව්‍යවාදය පිළිබඳ ප්‍රවේශයෙන් සහ මනස විවිධ මණ්ඩලවලට බෙදී තිබෙන බවත් විවිධ විෂයයන් ඉගැන්වීමෙන් ඒ ඒ මණ්ඩල දියුණු කළ හැකි ය යන මනස පිළිබඳ මණ්ඩලවාදය සම්බන්ධ ප්‍රවේශය ලෙස ප්‍රවේශ දෙකක් යටතේ ඉදිරිපත් කළ හැකි ය. සංඝටනවාදී න්‍යායයට අනුව ඉගෙනීමක් යනු ස්නායු සෛල පද්ධතියකට නව මාවතක් විවෘත කිරීමක් වන බවත්, කටපාඩම් කිරීම ස්මරණයට බලපෑමක් නොකරන බවටත් ප්‍රකාශ කරයි.

සර්වසම අංග පිළිබඳ න්‍යාය, සාම්‍ය මූලධර්ම න්‍යාය සහ අනන්‍යය මූලාංග පිළිබඳ න්‍යාය ලෙස ද හඳුන්වයි. මෙම න්‍යායයෙන් කියවෙනුයේ එක අවස්ථාවක අප ඉගෙනගත් කිසියම් හැකියාවක්, ඒ හා සමාන තවත් අවස්ථාවක දී ක්‍රියාත්මක විය හැකි බවයි. පුද්ගලයෙකු ඉගෙනගත් දෙයක් සාමාන්‍යකරණය කළ ප්‍රමාණය අනුව පුහුණු මාරුව සිදුවන බව, සාමාන්‍යකරණය පිළිබඳ න්‍යායයෙන් කියවේ.

තැත්මාරුව පිළිබඳ න්‍යාය ද ඉගෙනුම් මාරුව පිළිබඳ ව ඉදිරිපත් වී ඇති තවත් එක න්‍යායයකි. මෙම න්‍යායයට අනුව, යම්කිසි ගැටලුකාරී අවස්ථාවක අභ්‍යන්තර ව්‍යුහය සම්බන්ධයෙන් ලබාගන්නා දැනුම සහ අවබෝධය, එයට වඩා වෙනස් වූ ගැටලු අවස්ථාවකට මාරු කළ හැකි බව කිය වේ. ඉගෙනීමට ඉගෙනීම පිළිබඳ න්‍යායයේ දී එකම ආකාරයක සහ එකම විධියක ගැටලු විසඳන අයෙක් ඒ හා සමාන වෙනත් ගැටලුවක් විසඳීමට හැකියාවක් ලබන අතර ම ඒවා ඉක්මනින් ම විසඳීමට ද අවස්ථාව ලැබේ.

ඉගෙනුම් මාරුව හෙවත් පුහුණු මාරුව සඳහා බලපාන සාධක කිහිපයකි (ජයසූරිය, 1974). පරමාදර්ශ, කරුණු සංවිධානය සහ ක්‍රමය, මූලධර්ම පුහුණුව, බුද්ධිය, කාර්යය සාම්‍යය සහ ඉගෙනුම් ඉඟි ඒ අතර වේ. ඉගෙනීමක් සිදුවන අවස්ථාවක දී පිහිටි සැලැස්ම අනුව එම සැලැස්මෙහි ලක්ෂණ හෝ ඉඟි, ඉගෙනුමට බලපෑමක් ඇති කරන බව ඉගෙනුම් ඉඟි යන්නෙන් අදහස් වේ. තවද ඉගෙනුම් මාරුවට බලපාන තවත් එක සාධකයක් වන්නේ බුද්ධියයි. මිනිසෙකුට උපතින් ම හෙවත් සහජයෙන් ම එන බුද්ධිය මින් අදහස් වේ. නිවැරදි

අන්දමින් පුහුණු මාරුවක් සිදු වීමට අනිවාර්යයෙන් ම බුද්ධිය නමැති සාධකය බලපාන බව කිව හැකි ය. ඒ අතරම කාර්යය සාම්‍යය යන සාධකය ද මෙහිදී ඉතාම වැදගත් වේ. උදාහරණයක් ලෙස සමාන ස්වරූපයෙන් හෙබි විෂයන් අතර සහ අත්දැකීම් අතර මාරුවීම ඉතා පහසු වේ. අපි සියලු දෙනා මෙම අත්දැකීම ලබා ඇත්තෙමු.

ගුරු භූමිකාවේ ඇති අතිශය වැදගත් සාධකයක් වන්නේ ශිෂ්‍යයා තුළ චර්යාමය වෙනසක් ඇති කිරීමයි. ඒ සඳහා දැනුම, ආකල්ප සහ කුසලතා වෙන වෙන ම නිශ්චය කර ගනිමින්, එම චර්යාමය වෙනස ඇති කිරීමට පන්ති කාමරය සූදානම් කර ගත යුතු ය. ඉගෙනුම් මාරුව නමැති සාධකය මෙහිලා අතිශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. තවද ඉගෙනුම් මාරුව සිදුවන ලෙස විෂය කරුණු අනුපිළිවෙලින් සංවිධානය කිරීමේ දී ද ගුරුවරයාට මෙම සංකල්පය භාවිත කළ හැකි ය (ජයසූරිය, 1974). දරුවන් තුළ ඉහළ සාධනයක් ඇති කිරීම සඳහා මෙන්ම ඉගැන්වීමේ ශිල්පීය ක්‍රම, වඩාත් උචිතව භාවිත කිරීම සඳහා පුහුණු මාරුව භාවිත කිරීමට ගුරුවරයාට හැකි ය. තවද පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත වීමේ දී ශිෂ්‍යයා ලබන අත්දැකීම් පසු කාලීන ජීවිතයට බලපාන බව ඒත්තු ගැන්වීම සිදු කිරීම කළ යුතු ය (නෙත්තානන්ද, 1973).

සැබෑ ජීවිතයේ සැබෑ අත්දැකීම්වලට තමන් ඉගෙනගන්නා දෙය සැමවිට ම සම්බන්ධ වන බව ගුරුවරයා ප්‍රායෝගිකව ම පෙන්වා දිය යුතු ය. පන්ති කාමරය තුළ අප ඉගෙනගන්නා කරුණු සැමවිට ම පාසලට සීමා වන්නක් නොවන බවත් එදිනෙදා ජීවිතයේ දී එම සංකල්ප ප්‍රායෝගිකව භාවිත කරනා ආකාරයත් ගුරුවරයා පෙන්වා දිය යුතු ය. ප්‍රතිපෝෂණ සහ දරුවන් දිරිමත් කිරීම යන සාධක සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී, පුහුණු මාරුව සාර්ථක වීමට උක්ත සාධක ද්විත්වය එකහෙලාම උපකාරී වන බව ගුරුවරයා මතක තබා ගත යුතු ය. සුදුසු සැම අවස්ථාවක ම අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙමින් ශිෂ්‍යයා ඉදිරියට ගෙන යාමට ගුරුවරයාට වගකීමක් ඇත. එනිසා ශිෂ්‍යයෙකු කරනා ඕනෑම යහපත් ක්‍රියාකාරකමක දී මෙන් ම, යම් යම් සාර්ථක ප්‍රතිඵලවල දී ශිෂ්‍යයා දිරිමත් කිරීම කළ යුතු ය (Dash, 2004). විෂයමාලා සංවිධානය සම්බන්ධයෙන් අවධානය යොමු කරනා විට ඉගෙනුම් මාරුව යන සාධකය අතිශය

වැදගත් වේ. විෂයමාලාව යනු පාසලක හෝ විශේෂිත පාඨමාලාවක හෝ වැඩසටහනක උගන්වන පාඩම් සහ අධ්‍යයන අන්තර්ගතයයි. ශබ්දකෝෂවල, විෂයමාලාව බොහෝ විට පාසලක් විසින් පිරිනමනු ලබන පාඨමාලා ලෙස අර්ථ දැක්වේ. සිසුන්ගේ යහපත් ගුණාංග වර්ධනය කිරීමට උපකාර වන ලෙස විෂයමාලාව නිර්මාණය කර ඇත. එය ඉගෙන ගන්නන්ගේ ශාරීරික, සමාජීය සහ සදාචාරාත්මක ගුණාංග වර්ධනය කිරීමට උපකාරී වේ. විෂයමාලාව පාසල් හෝ විශ්වවිද්‍යාල ආදී ඕනෑම ඉගෙනුම් ආයතනයක "හදවත" ලෙස සැලකේ (නෙත්තානන්ද, 1973).

විධිමත් අධ්‍යාපනයේ වැදගත්කමත් සමග ම අපේ සමාජයේ සිදු වූ වෙනස්කම් විෂයමාලාව ගතික ක්‍රියාවලියක් බවට පත් කර ඇත. රටක කාලීන අවශ්‍යතා සහ උවමනා එපාකම් සලකා බලමින්, ඊට උචිත ලෙස විෂයමාලාව සකස් කළ යුතු ය (Jagannath, 2007). මෙලෙස, විෂයමාලා සම්පාදන කාර්යයේ දී ද ඉගෙනුම් මාරුව නම් සංකල්පයට අප අවධානය ලබා දිය යුත්තේ එහෙයිනි. තවද රටක ජාතික අරමුණු ඉටු කර ගැනීමෙහි ලා විෂයමාලාව අතිශය වැදගත් කාර්යයක් ඉටු කරයි. ඒ අනුව මෙහිදී අප අවධාරණය කළ යුත්තේ ශිෂ්‍ය ජීවිතයට සකාර්යය ලෙස පුහුණු මාරුවක් ලබා දීමට උචිත ලෙස විෂයමාලාව සකස් කළ යුතු බවයි. ඒ අනුව විෂයමාලා සම්පාදකයන් විසින් සැම විටම අනාගත ජීවිතයේ දී ප්‍රයෝජනවත් වන අන්දමින් ධනාත්මක ලෙස මාරු කළ හැකි ප්‍රයෝජනයට ගත හැකි විෂය සන්ධාරයක් ඉදිරිපත් කිරීම අවශ්‍යය වේ (ජයසූරිය, 1974). මේ සියලු ම කරුණු සලකා බලනා විට විෂයමාලාවක් ශිෂ්‍යයාගේ දෛනික ජීවිතයට අනුකූල විය යුතු අතරම එම අවශ්‍යතා සපුරාලන්නක් විය යුතු ය. එමෙන් ම විෂයමාලාවක් සැමවිට ම උපයෝගීතාවක් ගෙන දෙන්නක් මෙන්ම, ශිෂ්‍යය කේන්ද්‍රීය බවකින් යුක්ත වීම ද අනිවාර්යය සාධකයක් වේ. ශිෂ්‍ය අත්දැකීම් මත පදනම් ව සහ ඔවුන්ගේ අභිරුචීන් ද සලකා බැලීම කළ යුතු ය. සැමවිට ම සිසුවා පන්ති කාමරය තුළ ඉගෙනගන්නා දෙය ප්‍රායෝගික ජීවිතයට අදාළ කරගත හැකි විය යුතු ය (මුතුලිංගම්, 1979). සැමවිට ම සමාජීය සහ ආර්ථික අවශ්‍යතා මත පදනම් වෙමින්, එම අවශ්‍යතා ඉටු කර ගැනීමට හැකිවන පරිදි විෂයමාලාවක් සම්පාදනය කිරීමටත් වග බලාගත යුතු ය. ඒ

හේතුව නිසාම විෂයමාලා සම්පාදනයේ දී ඉගෙනුම් මාරුව න්‍යායික වටිනාකමකින් යුක්ත මූලධර්මයක් ලෙස සැලකිය යුතු බව කිව මනා ය.

**සාරාංශය**

ඉගෙනුම් මාරුව හෙවත් පුහුණු මාරුව නැමති සංකල්පය පුද්ගලයෙකු යම් අවස්ථාවක දී ලබාගත් පුහුණුවක් හෝ ඉගෙනීමක් තවත් අවස්ථාවකට යොදා ගැනීමක් ලෙසින් ඉතා සරළ ව අර්ථ දැක්විය හැකි අතර එය යම්කිසි අවස්ථාවක දී අප ලබාගත් දැනුම, දක්ෂතා, යම් යම් පුරුදු, ආකල්ප වැනි අංගයන් පසු කාලීන ව යොදා ගැනීමක් ලෙස අර්ථ දැක්විය හැකි ය. පාසලෙන් ලබාගන්නා අත්දැකීම් සමූහය ශිෂ්‍ය ජීවිතයට පසු කාලීන ව අදාළ වන හෙයින් ඉගෙනුම් මාරුව හෙවත් පුහුණු මාරුව ශිෂ්‍යයා සම්බන්ධ ව කථිකා කිරීමේ දී ද අතිශය වැදගත් සාධකයක් බවට පත් වේ. සැම විටම න්‍යායාත්මක දෙය ශිෂ්‍යයාට ලබා දෙනවා මෙන් ම ප්‍රායෝගිකව එකී විෂය කරුණු භාවිත කරන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් ද අවධානය යොමු කරමින් ඉගැන්වීමේ කාර්යයේ නිරත වීමට ගුරුවරයා කටයුතු කළ යුතු ය. ඉගෙනුම් මාරුව සම්බන්ධයෙන් අවධානය යොමු කරන විට ඉගෙනුම් මාරුව සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති න්‍යායයන් සම්බන්ධයෙන් ද මෙහිදී මූලික අවධානය යොමු කර ඇති අතර ප්ලේටෝගේ සම්භාව්‍යයවාදය, මනස පිළිබඳ මණ්ඩල මතය, අනන්‍යය මූලධර්ම න්‍යාය... ආදිය සම්බන්ධයෙන් මූලික අවධානයක් යොමු කර ඇත. තව ද ඉගෙනුම් මාරුවට බලපාන විවිධ සාධක සහ ප්‍රායෝගිකව ගුරුවරයා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යොදා ගන්නා ආකාරය සම්බන්ධයෙන් ද අවධානය යොමු කර ඇත. මේ සියලු ම සාධක සලකා බැලීමේ දී නිගමනය කළ හැක්කේ ඉගෙනුම් මාරුව නමැති සාධකය අධ්‍යාපන ක්‍රියාවලිය සහ පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සමඟ අතිශය සමීප සබන්ධතාවක් ඇති බවයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ජයසූරිය, ජේ.ඊ. (1974). *අධ්‍යාපන විද්‍යා ලිපි*. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

නෙත්තානන්ද එස්. කේ. (1973). *අධ්‍යාපන මනෝ විද්‍යාව*. කොළඹඃ ලේක් හවුස් ග්‍රන්ථ ප්‍රකාශකයෝ

මුතුලිංගම්,එස්. (1979). *අධ්‍යාපන මනෝ විද්‍යාව හා මිනුම්*. කොළඹඃ සමයවර්ධන පොත් ප්‍රකාශකයෝ.

Dash. B.N. (2004). *Theories of education and education in the emerging Indian society*. Dominant Publishers and Distributors, New Delhi.

Jagannath Mohanty, (2007). *Modern trends in educational technology*. Neelkamal Publications, New Delhi.

Mc Gettrick. J (2004). *Value Development in Higher Education*. Neelkamal Publications, New Delhi.